# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2014 ඔක්තෝබර් මස 21 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.10.07 දින අසන ලද ප්‍රශ්ණය;

(ප්‍ර/VI (1) /14/39)

අ) ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් ගණන කියද?

ආ) එම පාසල්වල 2,3,4 හා 5 ශ්‍රේණිවල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති ශිෂ්‍ය මුළු ගණන කියද?

ඇ) පාසල් හා ශ්‍රේණි වලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ඈ) නො එසේනම් ඒ මන්ද?

02. ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.10.07 දින අසන ලද ප්‍රශ්ණය;

(ප්‍ර/VI (1) /14/40)

අ) හෝමාගම අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් ගණන කියද?

ආ) එම පාසල්වල 2,3,4 හා 5 ශ්‍රේණිවල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති ශිෂ්‍ය මුළු ගණන කියද?

ඇ) පාසල් හා ශ්‍රේණි වලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ඈ) නො එසේනම් ඒ මන්ද?

01.

03. ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මන්ත්‍රිතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.10.07 දින අසන ලද ප්‍රශ්නය;

(ප්‍ර/VI (1) /14/41)

අ) පිළියන්දල අධ්‍යාපන කලාපයේ පළාත් සහා පාසල් ගණන කියද?

ආ) එම පාසල්වල 2,3,4 හා 5 ශ්‍රේණිවල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති ශිෂ්‍ය මුළු ගණන කියද?

ඇ) පාසල් හා ශ්‍රේණි වලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ඈ) නො එසේනම් ඒ මන්ද?

04. ගරු එස්.එම්.මරික්කාර් මන්ත්‍රිතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් 2014.10.07 දින අසන ලද ප්‍රශ්නය;

(ප්‍ර/VI (1) /14/42)

අ) දෙහිවල ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශයට අයත් ගල්කිස්ස පොදු සුසාන භූමිය තුළ අළුත්වැඩියාවන් සිදු කරන බව ඔබතුමා දන්නේද?

02.

ආ) එම අළුත්වැඩියාවන් සිදුවන්නේ කුමන රාජ්‍ය හෝ පළාත් ආයතනයක් යටතේදැයි සඳහන් කරන්නෙද?

ඇ) i. එම ඉදිකිරීම් සදහා මිළ ගණන් කැදවීමක් සිදු කර තිබේද?

ii. එම ඉදිකිරීම අධීක්ෂණය සිදු කරන්නේද? එසේ නම් ඒ කුමන ආයතනයද?

ඈ) මෙම අළුත්වැඩියාවන් හරහා ගාලු පාරට සමාන්තරව පොදු සුසාන භූමියේ තිබූ වටිනා තේක්ක ගස් ගණනාවක් කපා ඉවත් කිරීමට නිත්‍යානුකූල අනුමැතියක් ලබාදී තිබේද?

ඉ) එසේ නම් එම අනුමැතිය දුන් රාජ්‍ය හෝ පළාත් ආයතනය සඳහන් කරන්නේද?

ඊ) එසේ කපා ගලවා ඉවත් කරන ලද වටිනා තේක්ක දැව කදන් පිළිබඳව ගන්නා ලද ක්‍රියා මාර්ගය කවරේද?

උ) එම දැව කදන් අලෙවි කලේ නම් ඒ සදහා ලැබුන මුදල් පිළිබදව ගන්නා ලද ක්‍රියා මාර්ගය පැහැදිලි කරන්නේද?

09.
Co
We
5th
Se
Ba

- කාර්ය පටිපාටි රීති 31 අ(1) විධිවිධාන අනුව පිළිතුරු දීමට කල්ගන්නා ලද ප්‍රශ්ණය:

05. ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර ග්‍රාම සංවර්ධන. සංචාරක. ආයෝජන ප්‍රවර්ධන, සම්බන්ධීකරණ හා සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් 2014.10.07.දින සභාව කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) 14/ADj/01)

i. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සඳහා බස්නාහිර පළාත තුලට පැමිණෙන හා පිටවනු ලබන දුරගමන් සේවා එසේ නොමැති නම් ගමනා ගමන කොමිෂන් සභාවට (**N.T.C**) අයත් බස් රථ පරීක්ෂා කිරීමට බලය තිබේද?

අ. එසේ බලය නොමැති නම් අනිකුත් පළාත් සභා මගින් එම පළාත් සභා බල ප්‍රාදේශයට මෙම බස් රථ ඇතුළුවීමේදී හා පිටවීමේදී පරීක්ෂා කිරීම. ( ව පත්‍රිකා නිකුත් කිරීම. පිවිසුම් ලබා ගැනීම සිදුකරන්නේ කෙසේද?

ii. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් මෙලෙස මෙම බස් රථ පරීක්ෂා නොකිරීම නිසා බස්නාහිර පළාත් ප්‍රවාහන අධිකාරියට අයත් බස් හිමියන් දැඩි අපහසුතාවයකට පත්ව ඇති බව ඔබතුමා දන්නෙහිද?

iii. බැස්ටියන් මාවත බස් පර්යන්තයෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී යට පිවිසුම් ගාස්තු ලැබී තිබේද?

අ. මීට ඉහත සිටි පළාත් ප්‍රවාහන අමාත්‍යවරයා හා ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයා විසින් මෙකී අධිකාරියේ බලතල අත්තනෝමතිකව කප්පාදු කර ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

ආ. නැවත මෙම අධිකාරිමය බලය පළාත් ප්‍රවාහන අධිකාරිය සතු කීරීමට ඔබතුමා කටයුතු කරන්නේද?

06. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /14/43)

අ. කළුතර ප්‍රාදේශීය සභාව මගින් සංවිධානය කල 'පොසොන් උදානය 2014' සඳහා පහන් කූඩු කූට් කොපමන ඉදිකලේද?

ආ. එම කූට් ඉදිකිරීම පෞද්ගලික ආයතන වෙතින් ටෙන්ඩර් කැඳවනු ලැබුවේද? ඒ කූට් කීයක් සඳහාද?

ඇ. එම ටෙන්ඩරය ලබාගත් ආයතනය කුමක්ද? එම ආයතනය කූට් 40ක් සඳහා ඉදිරිපත්කල මිල ගණන කොපමනද?

ඈ. එම ආයතනය මගින් අඩි 15-15 කූට් කීයක් ඉදිකලේද? ඒ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමනද?

ඉ. එම ආයතනය මගින් අඩි 10-10 කූට් කීයක් ඉදිකලේද? ඒ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමනද?

**07.** ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට :

(ප්‍ර/VI (1) /14/44)

අ. 2014 ජුනි 12-15 කාලය තුල 'කළුතර ප්‍රාදේශීය සභාව' විසින් කළුතර, නාගොඩ, ගල්ලස්ස ප්‍රදේශයේදී පොසොන් කලාපයක් පැවැත්විද?

ආ. එම කලාපය සඳහා වැයකල මුළු මුදල කොපමනද? එයින් ප්‍රාදේශීය සභාව විසින් වැයකල මුදල කොපමනද?

ඇ. සභාව මගින් ඉදිකරන ලද තොරන. පොසොන් කලාපයේ ශබ්ද විකාශන යන්ත්‍ර, වේදිකාව ඉදිකිරීම, විදුලි අලෝක කරණය. පහන්කූඩු කූටි ඉදිකිරීම සඳහා අදාල ගෙවීම් සිදුකර ඇත්තේ කවර දිනයන්හිද? කවර ආයතනයන්වද? කවර චෙක්පත් අංක යටතේද?

ඈ. එම චෙක්පත් ප්‍රදේශීය සභාවෙන් භාරගෙන ඇත්තේ කවුරුන් විසින්ද? එම පුද්ගලයා දැනට ප්‍රාදේශීය සභාවේ දරන තනතුර කමක්ද?

ඉ. මෙම එක් එක් අයිතමයන් සඳහා ගෙවීම් සිදුකිරීමට ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගත්තේ කවදාද?

ඊ. මෙම ගෙවීම්වලට අදාලව ප්‍රාදේශීය සභා සභාපතිවරයා විසින් මුදල් රෙගුලාසි හා සභාරීති උල්ලංඝනය කර තිබේද?

උ. එසේ තිබේනම් ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද?

**08.** ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට :

(ප්‍ර/VI (1) /14/45)

අ. 'ගම්පහ අරුණෝදය' නමින් සිදුව නගර සභාවට අයත් අමන්දොළුව. කුරුඳුවත්ත මාර්ගය රුපියල් මිලියන 9.3 වැයකර සංවර්ධනය කරන බව සඳහන් කර අතිගරු ජනාධිපතුමාගේත්, අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගෙත්, හා අමාත්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියගේත්, ජායාරූප සහිත පුවරුවක් බස්නාහිර පළාත් සභා මැතිවරණයට පෙර පළත් සභා මැතිවරණ අපේක්ෂකයන්ගේ සහභාගිත්වයෙන්ද උත්සවාකාරයෙන් සවිකර මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ කල බව පිළිගන්නේද?

ආ. එම මාර්ග සංවර්ධනයේ වගකීම පවරන ලද්දේ කුමන ආයතනකින්දැයි සදහන් කරන්නේද?

ඇ. එම පුවරුවේ සදහන් පරිදි එම රුපියල් මිලියන 9.3 මුදල වැයකර මාර්ගය සංවර්ධනය කලේද?

ඈ. නොඑසේනම් එම මුදල වෙනත් කටයුත්තක් සදහා යෙදවූයේද?

ඉ. අද එම මාර්ගය බොහෝසේ අබලන්ව ප්‍රදේශයේ ජනතාවට පයින් ගමන් කිරීම පවා අපහසු තත්වයකට පත්ව ඇති බව පිළිගන්නේද?

ඊ. එම මාර්ගය සංවර්ධනය කර දීමට අවශ්‍ය පියවර ගන්නේද?

උ. එසේනම් ඒ කවදාද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ කටයුතු I.

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව :

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"*

සභාවේ කටයුතු II.

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව :

"අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ දැක්වෙන වැඩකටයුතු කාර්ය පටිපාටි රීති අංක 52 (5) , 57 (4) හා 57 (5) හි දැක්වෙන විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වා ගෙන යා යුතුය"

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා:

"ඔන් ලයින් ලොතරැයි ව්‍යාපාරය 2014 අප්‍රේල් මස මුල් සතියේ සිට ක්‍රියාත්මක වන අතර. එහි මූලස්ථානය කොළඹ 02. නවම් මාවතෙහි පිහිටා ඇත තවද රට පුරා එවැනි මධ්‍යස්ථාන 3000 ක් ස්ථාපිත කිරීමට සූදානම් කර ඇත. මෙය ලොතරැයියක මුවාවෙන් වන සූදුවක් වන අතර, රටේ තරුණ පරපුර වේගයෙන් ඊට ඇබ්බැහි වෙමින් පවතී. එහි ඇති වඩාත් භයානකකම වන්නේ මේ තුල ලොටෝ සහ ජැක්පොට් යන ක්‍රීඩාවන්ද අන්තර්ගත වීම සහ නිවසේ සිටද ,මෙම ලොතරැයි සමග ක්‍රියා කළ හැකි වීමයි. මෙවැනි උවදුරකින් බස්නාහිර පළාතේ ජනතාව මුදා ගැනීම මෙම පළාත් සභාවේ ප්‍රමුඛතම යුතුකම හා වගකීමද වන බැවින් මෙවැනි ව්‍යාපාර වලට ආධාර අනුබල නොදීමට සියළු වගකිව යුතු පුද්ගලයන් සහ ආයතන වගබලා ගත යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

(යෝ/VI (1) 14/06)

02. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය:

'බස්නාහිර පළාත තුළ පිහිටි ඇතැම් අධිකරණ බල සීමා නැවත නිර්ණය කර නව අධිකරණ කලාපවලට වෙන් කිරීමටත්, ඒ අනුව කාර්ය භාරයයන් පැවරීමටත්, රජය කටයුතු කර ඇතත්, එහිදී නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම නිසා ජනතාවට විවිධ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුව ඇතිවා මෙන්ම විශාල මුදල් ප්‍රමාණයක් නාස්ති වීමක් ද සිදු වේ. ජනතාවට, පොලිස් නිලධාරීන්ට මෙන්ම අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ට ඉතා සමීප අධිකරණයක් තිබියදී වාහන සඳහා ඉන්ධන වැය කරමින් දුරින් පිහිටි අධිකරණය සඳහා ගමන් කිරීමට සිදුව ඇත. එබැවින් මෙම සියලු කරුණු නිසි අධීක්‍ෂණයකට යටත් කොට නිසි අත්දැකීම් ඇති නිලධාරීන්ගෙන් සංයුක්ත කමිටුවක් මගින් ශ්‍රී ලංකාව තුළ අධිකරණ බල සීමා නැවත නිර්ණය කිරීම ක්‍රමවත්ව සිදු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කරයි'

(යෝ/VI (1) 14/07)

## XI. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්‍ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා (බ.ප);

'2014.පරිපූරක ඇස්තමේන්තු — 02'

2014 වර්ෂයේ පහත සඳහන්. අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපාදන සලසා දීම සඳහා එනම්

බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා කාර්යාල සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/2013 මගින් වැඩිකරන ලද ජීවන වියදම් දීමනා ගෙවීම හා අවශ්‍යයෙන්ම ගෙවිය යුතු වැටුප් හා දීමනා ගෙවීමට අවශ්‍ය අමතර ප්‍රතිපාදන සලසා දීමද,

බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතන සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/2013 මගින් වැඩිකරන ලද ජීවන වියදම් දීමනා ගෙවීමට අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීමද,

සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩි වූ අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම හා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍ය සැපයීම් වෙනුවෙන් අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීමද,

2014 වර්ෂයේ අයවැය යෝජනා අනුව පශු වෛද්‍ය සේවා දියුණු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීමද,

පළාත් සභා සංවර්ධන කාර්යයන් අපේක්ෂිත ඉලක්කකරා ළඟා කරවීමට රු.ද.ල. 475 ක අමතර ප්‍රතිපාදන සැලසීමද යන කාරණා වෙනුවෙන් පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන '2014 පරිපූරන ඇස්තමේන්තු - 02' (රු 1,608,099,000/=) අනුමත කළ යුතුය'

02. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා (බ.ප);

'**2014 පරිපූරක ඇස්තමේන්තුව-02ට අදාල විසර්ජන ප්‍රඥප්තිය**'

'2014 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව-02 සඳහා අවශ්‍ය රුපියල් එකසිය හැට කෝටි අසූ ලක්ෂ අනූනව දහසක් (රු 1,608,099,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්. එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2014 අංක...දරණ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය'

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2014.10.09 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.